**ශීර්ෂය 192 - නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය**

---------------------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

------------------

**1.1 තත්ත්වාගණනය කල මතය**

---------------------------------

නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 12 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 04 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකිම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

----------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.
ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.
ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ සැසඳීමක් කළ නොහැක. තවද, ඒ හේතුවෙන්ම ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශද මෙම වාර්තාවෙන් ඉදිරිපත් කර නැත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛනය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථාවක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඉහත චක්‍රලේඛය ප්‍රකාරව සහ විගණන පනතේ 16(2) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් 2019 පෙබරවාරි 28 දින හෝ ඊට පෙර මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාවද ඉදිරිපත් කළ යුතු නමුත් එසේ ඉදිරිපත්කර නොතිබුණි. | පනතේ විධිවිධාන හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කළ යුතු වීම. | මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කිරීම අතපසුවීමකින් කළ නොහැකි විය. කඩිනමින් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කරමි. |

### 1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) පුනරාවර්තන වැය විෂයයන් 31 ක් සඳහා සලසා තිබූ රු.273,577,140 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.147,716,561 ක් ඉතිරිවී තිබුණි. එම ඉතිරිවීම් සියයට 15 සිට සියයට 100 දක්වා පරාසයන් ගෙන තිබුණි. | ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂම තාවයකින් උපයෝජනය කළ යුතු වීම. | 2018 මැයි 12 දින මෙම අමාත්‍යාංශය රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ කළ අතර 2018 නොවැම්බර් 05 දින නීතිය හා සාමය විෂයපථය ආරක්ෂක අමාත්‍යාංශය යටතට පත් කරන ලදී. මෙම වෙනස් වීම හේතුකොටගෙන වසර මුලදී සැලසුම් කළ විෂය ක්ෂේත්‍ර වෙනස් වීම නිසා ඉතිරිවීම් සිදු විය. |
| (ආ) මූලධන වැය විෂයයන් 15 ක් සඳහා සලසා තිබූ රු.2,580,460,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.1,202,452,583 ක් ඉතිරි වී තිබුණි. එම ඉතිරිවීම් සියයට 25 සිට සියයට 99 දක්වා පරාසයන් ගෙන තිබුණි. | - එම - | - එම - |

**1.6.3** **මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

**--------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2018 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ දේපල පිරියත හා උපකරණ වර්ෂය තුලදී මිලදී ගැනීම් වටිනාකම රු.784,077,872 ක් වුවද ACA-2 (ii) අනුව එය රු.679, 557, 046 ක් ද වූ නමුත් 2018 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර වත්කම් වාර්තාව අනුව වටිනාකම රු.595,748,110 ක් විය. | වෙනස්කම් හදුනාගෙන නිවැරදි කිරිමට කටයුතු කළ යුතුවීම. | පෙන්වාදී ඇති කරුණු අමාත්‍යාංශයේ ලිපි ලේඛන පරීක්ෂා කර හදුනාගත නොහැකි බැවින් තවදුරටත් ගැඹුරු පරීක්ෂාවක් කර ඉදිරියේදී පිළිතුරු සැපයිමට කටයුතු කරමි. |

**1.6.4** **බැරකම් නොසැසඳීම්**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව ඉදිරිපත් කළ බැරකම් වටිනාකම රු.704,837,693 ක් වුවද මූල්‍ය ප්‍රකාශන සමඟ වූ සටහන (iii) ට අනුව එම බැරකම් වටිනාකම රු.680,761,741 ක් වූයෙන් රු.24,075,952 ක වෙනසක් නිරීක්ෂණය විය. | වෙනස්කම් හදුනාගෙන නිවැරදි කිරිමට කටයුතු කළ යුතු වීම. | මෙම කරුණු අදාල වන්නේ විශේෂ කාර්ය බලකායට හා දක්ෂිණ සංවර්ධන අතුරු මණ්ඩලයේ ගිණුම් සඳහා වේ. භාණ්ඩාගාර වාර්තාවල සඳහන් වටිනාකම විශේෂ කාර්ය බලකායේ ලිපිගොනුවල වාර්තා වී නැති අතර දක්ෂිණ සංවර්ධන අතුරු මණ්ඩලයේ ගිණුම් වාර්තා පිළිබඳව පැහැදිලි කිරීම් ඉදිරිපත් කරන ලෙස දැනුම් දී ඇත. |

**1.6.5** **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතික වීම්.**

**----------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන් දීමේ නිලධාරී | ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව කටයුතු කළ | විගණන පනතේ හදුන්වා දී ඇති විධිවිධාන ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳ කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු විය. එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයක් සිදු කල බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | යුතුවීම. | |
| (ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන් දීමේ නිලධාරී සහතික විය යුතු වුවත් වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් කරුණු වලට අනුව එසේ සිදුව නොතිබුණි. | ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව විශේෂ කාර්ය බලකාය සඳහා ඵලදායි අභ්‍යන්තර විගණන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතු වීම. | විගණන හා කළමනාකරණ කමිටුව රැස්වීම් 4 ක් නිසි පරිදි පවත්වා ඇති අතර වාර්ෂික විගණන සැලැස්මට අනුව ආයතනයේ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා විගණනයක් සිදු කර ඇත. මේ වන විට නීතිය හා සාමය අංශයේ විගණන කටයුතු ආරක්ෂක අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් සිදු කරයි. |

**1.6.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2010 මැයි 14 දිනැති CA/1/17/1 අංක දරන රාජ්‍ය වියදම් කළමනාකරණ ලිපියේ 2.2 හා 3.4 ඡේදයන් ප්‍රකාරව අමාත්‍යවරයා/රාජ්‍ය අමාත්‍යවරයා ධූරය දරන කාලයට පමණක් සීමාවන පරිදි තාවකාලික පදනම මත සේවයේ යොදවාගන්නා සහායක කාර්ය මණ්ඩලය වෙත වෙන්කරන ලද වාහන අමාත්‍යාංශ විෂය වෙනස් වීමේදී ආපසු භාරදිය යුතු වුවද අමාත්‍යාංශය සතු වාහන 04 ක් 2018 මාර්තු මස සිට මේ දක්වා ආපසු භාරදී නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව අදාල වාහන අමාත්‍යාංශය වෙත භාර ගැනීමට කටයුතු කළ යුතු වීම. | අදාල නිලධාරීන් දැනුවත් කර ඇතත් මෙතෙක් එම වාහන භාරදීමට කටයුතු කර නැති අතර වාහන ආපසු පවරා ගැනීමට අවශ්‍ය කටයුතු තවදුරටත් සිදු වෙමින් පවතී . |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| පුනරාවර්තන වැය විෂයයන් 12 ක් වෙත එකතුව රු.මිලියන 11.00 ක පරිපූරක ප්‍රතිපාදන සලසාගෙන තිබුණ අතර එම ප්‍රතිපාදනයෙන් රු.මිලියන 10.30 ක් ඉතිරි වී තිබුණි. ඉතිරිවීම් පරාසය සියයට 80 සිට සියයට 100 දක්වා විය. | පරිපූරක ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව උපයෝජනය කළ යුතු වීම. | 2018 මැයි මාසය වන විට අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත අනියුක්ත කිරීම හා රාජ්‍ය අමාත්‍ය තනතුර අහෝසි වීම මත පරිපූරක ප්‍රතිපාදන ඉතිරි විය. |

**2.2 අත්තිකාරම් ගිණුම් කටයුතු**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැසඳුම් ප්‍රකාශය අනුව 2018 දෙසැම්බර් 31 දිනට මිය ගිය, විශ්‍රාම ගිය වැඩ තහනම් කළ හා සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 32 කුගෙන් අයවිය යුතු ණය ශේෂය රු. මිලියන 2.49 ක් වූ අතර එහි කාල විශ්ලේෂණය අනුව අවුරුදු 02 කට වැඩි ණය ශේෂයන්ගේ එකතුව රු.මිලියන 1.05 ක් විය තවද, විශ්‍රාම ගිය හා මියගිය නිලධාරීන් 4 කගේ හිඟ හිටි ණය ශේෂය රු.631,891 ක් ද 2014 වර්ෂයේ වැඩ තහනම් කළ නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.265,687 ක්ද අයකර ගැනීමට ආයතනය මෙතෙක් අපොහොසත් වී තිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට විධිවිධාන ප්‍රකාරව කඩිනම් පියවර ගත යුතු වීම. | 2019 මැයි 31 දින වන විට අයවිය යුතු හිඟ ශේෂය රු.1,178,896 ක් දක්වා සියයට 53 ක අඩු වීමක ප්‍රගතියක් පෙන්වන අතර නිලධාරීන් සංඛ්‍යාවද 16 ක් දක්වා අඩු වී ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) අමප/16/1991/740/010 හා 2016 ඔක්තෝබර් 16 දින අමාත්‍ය මණ්ඩලය අනුමත කරන ලද කාන්තා ගෘහ මූලික පවුල් සඳහා වන තුන් අවුරුදු (2018 -2020) ජාතික සැලසුමේ අන්තර්ගත වැඩසටහන් ක්‍රියාවට නැංවීමේ එක් වගකිව යුතු ආයතනයක් වශයෙන් මෙම අමාත්‍යාංශය නම් කර තිබුණි. ඒ අනුව මෙම අමාත්‍යාංශය යටතේ 2018 වර්ෂය තුලදී වැඩසටහන් 20 ක් සඳහා රු. මිලියන 2.75 ක් ඇස්තමේන්තු කර ක්‍රියාත්මක කරවීමට සැලසුම් කර තිබුණද 2018 වර්ෂය තුලදි එම වැඩසටහන් ආරම්භකර ක්‍රියාත්මක කර නොතිබුණි. | ජාතික සැලසුමේ අන්තර්ගත වැඩසටහන් ක්‍රියාවට නැංවීමට කටයුතු කළ යුතුය. | ප්‍රතිපාදන ලබා දීම සම්බන්ධව සලකා බැලීම සඳහා අදාල සැලැස්ම ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට යොමුකර නිර්දේශ ලබා ගත යුතු බව අනාවරණය වන අතර 2018 වර්ෂයේ දී ප්‍රතිපාදන ලැබී නොමැත. |
| (ආ) අංක 16/1144/750/006 දරන 2016 ජුලි 05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හා ඒ සඳහා යෝග්‍ය පරිදි ප්‍රතිපාදන සලසා ගැනීම පිණිස 2017 වර්ෂයේ සිට අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු තුල වෙනම වැය විෂය අංකයක් හඳුන්වා දීමට අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව හඳුන්වා දුන් 1703 වැය විෂය අංකය යටතේ 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන සලසා ගත යුතු අතර රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ‘‘ක්‍රමෝපාය පිළිබඳ සැලැස්මක්’’ සකස් කළ යුතු විය. එහෙත් සමාලෝචිත වර්ෂයේදී එසේ ක්‍රියාකර නොතිබුණි. | ක්‍රමෝපාය පිළිබඳ සැලැස්ම සකස් කළ යුතු වීම. | සැලැස්ම මෙතෙක් සකස් කර නැති බව පිළිගනිමි. මේ සම්බන්ධයෙන් පත් කර ඇති කමිටු විසින් රැස් වී සාකච්ඡා කර ඇති අතර එහි තීරණ මත නිලධාරීන් 24 දෙනෙක් සඳහා පුහුණුවීම් ලබා දී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අමාත්‍යාංශයේ යටතේ පවතින ශ්‍රී ලංකා පොලීසිය සඳහා වාර්ෂික ඇස්තමේන්තු මගින් ලබා දුන් මූලධන ප්‍රතිපාදන ඉතිරිවීම් වර්ෂ 2016- 2018 කාල පරිච්ඡේදය තුළ පිළිවෙලින් සියයට 39, සියයට 32 හා සියයට 36 මට්ටමේ පැවතුණි. මේ අනුව ශ්‍රී ලංකා පොලීසියේ ගොඩනැගිලි ඉදිකිරීම්, සන්නිවේදන ජාල සංවර්ධනය, විශ්වවිද්‍යාලය පිහිටුවීම හා වාහන මිලදී ගැනීම ඇතුළු සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අධීක්ෂණ කාර්යය අමාත්‍යාංශයෙන් ඉටුවීමේ දුර්වලතා පැවතුණි. | මූලධන ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව උපයෝජනය කිරීම. | 2018 වර්ෂයේ අමාත්‍යාංශය කිහිප විටක් වෙනස් වීම නිසා පරිපාලනයද වෙනස් වීම මත අදාල ලිපිගොනු අධ්‍යයනය කිරීමට යම් කාලයක් ගැනීම මත අධීක්ෂණ කාර්යයන්හි ප්‍රමාදයන් සිදුවී ඇති බව පිළිගනිමි. මේ වන විට ආරක්ෂක අමාත්‍යාංශයේ අධීක්ෂණය මත ප්‍රසම්පාදන ක්‍රියාදාමයන් ඉදිරියට ගෙන යනු ලබයි. |

**3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2014 – 2017 කාලරාමුව තුළ පෙරසවි ගොඩනැගිලි 196 ක් ඉදිකිරීමට නියමිතව පැවති අතර 2017 වර්ෂය අවසානයේදී ගොඩනැගිලි 44 ක වැඩ අවසන් නොවීම මත ව්‍යාපෘති කාලය 2018 දක්වා දීර්ඝකර තිබුණි. 2018 වර්ෂය අවසානයේ එයින් 19 ක වැඩ අවසන්ව නොතිබූ අතර තවත් කඳවුරු 02 ක ඉදිකිරීම් අවසන්ව නොපැවති බැවින් සමාලෝචිත වර්ෂය සඳහා වෙන්කර තිබූ රු.මිලියන 279.5 ක ප්‍රතිපාදනවලින් රු.මිලියන 113 ක් ඉතිරිවී තිබුණි. | නියමිත කාල රාමුව තුළ අපේක්ෂිත ඉලක්කයන් ඉටුකර ගත යුතු වීම. | කඳවුරු 5 ක ගොඩනැගිලි 28 ක් සඳහා අනුමැතිය ලබා ගත හැකි වූයේ 2017 අගෝස්තු 04 දිනදීය. 2018 වර්ෂයේ අවසානය වන විට සියලුම ඉදිකිරීම් කටයුතු අවසන්ව තිබූ අතර මුළු වියදම රු.මිලියන 279.4 කි. 2018 වර්ෂය අවසානයේදී අක්මුදල් නොලැබීම මත රු.මිලියන 113 ක් බැරකම් වාර්තාවක ඇතුළත් කරන ලදී. |
| (ආ) | අංක අමප/1610738/703/033 දරන 2016 මැයි 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරී සඳහා විශේෂ කාර්ය බලකායේ සංග්‍රාමික බල ඇණියක් මාලි රාජ්‍ය තුළ ස්ථාපිත කිරීමට අවශ්‍ය අවි ආයුධ, සන්නද්ධ රථ, ප්‍රවර්ථන වාහන, සන්නිවේදන උපකරණ ඇතුළු අනෙකුත් උපකරණ මිලදී ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. සාම | නියමිත කාල රාමුව තුළ අපේක්ෂිත ඉලක්කයන් ඉටුකර ගත යුතු වීම. | සැපයුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද භාණ්ඩ හා උපකරණ එක්සත් ජාතීන්ගේ පිරිවිතරයන් හා නොගැලපීමත්, ඇමරිකන් ඩොලරයේ අගය ඉහලයාමත්, වැට්බදු ප්‍රතිශත වෙනස් වීමත්, ආනයන බදු ඉහලයාම හා මිල ඇස්තමේන්තු විශාල ලෙස වැඩිවීම වැනි කරුණු හේතුවෙන් |

| | | |
|---|---|---|
| සාධක හමුදා රාජකාරී සඳහා නිලධාරීන් යෙදවීම තුලින් විදේශ විනිමය උපයා ගැනීම, නිලධාරීන්ගේ නිපුනතා සංවර්ධනය, ජාත්‍යන්තර අත්දැකීම් ලබා ගැනීම, නිලධාරීන්ගේ ජීවන තත්ත්වය ඉහල නැන්වීම හා සුදුසුකම් සහිත නිලධාරීන්ට අවස්ථාවක් ලබාදීම වැනි කරුණු තුලින් නිලධාරීන් අභිප්‍රේරණය කිරීම වැනි කරුණු අරමුණු කරගෙන නිලධාරීන් 320 දෙනෙකුට 2016 වර්ෂයේදී පුහුණුව ලබාදී තිබුණි. එමෙන්ම 2017 හා 2018 වර්ෂ දෙකේදී රු. මිලියන 792 ක් උපකරණ මිලදී ගැනීම සඳහා වැයකර තිබුණ අතර එම උපකරණ කටුකුරුන්ද කඳවුරේ ගබඩා කර තිබුණි. එහෙත් එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරී සඳහා එක්වීම 2019 මැයි මාසය වන විටත් ඉටුවී නොතිබුණි. | | අදාල ප්‍රසම්පාදන කටයුතු නිසි පරිදි ඉටුකරගැනීමට නොහැකි වීමෙන් අපේක්ෂිත නිමැවුම් මට්ටමට ලඟා වීමට නොහැකි විය. |

### 3.3 අනාර්ථික ගණුදෙනු

---------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විශේෂ කාර්ය බලකායේ ගෝනහේන කඳවුරේ ගබඩාව සඳහා පින්තාරු ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා වූ අංක STF/LOG/C/267/2017 දරන ඇණවුමට අදාලව මිලදී ගැනීමේදී එම පින්තාරු ද්‍රව්‍ය ඇසුරුම්වල සඳහන් උපරිම සිල්ලර මිලටත් වඩා රු.704,895 ක් (VAT සමඟ) ගෙවා තිබුණි. | උපරිම සිල්ලර මිලටත් වඩා වැඩි මිලට භාණ්ඩ මිලදී ගැනීමෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් අපේක්ෂිත මිල වාසිය අහිමි වන බැවින් ඒ පිළිබඳ අවධානය යොමු කළ යුතු වීම. | ලංසු ඇගයීමේදී වැට් බදු රහිත මිල භාවිතා කරන අතර ඒ අනුව ලකුණු කළ මිලට වඩා වැඩියෙන් ගෙවා ඇති මුදල රු.704,895 ක් නොව රු.211,498 ක් විය. නැවත ලංසු කැඳවීමේදී ගතවන කාලය, ලංසු කැඳවීමේ වියදම හා මිල ඉහල යාමේ අවධානම සැලකිල්ලට ගෙන භාණ්ඩ මිලදී ගැනීමට නිර්දේශ ලබාදී ඇත. මෙවැනි භාණ්ඩ මිලදී ගැනීමේදී නිෂ්පාදකයාට සහ බලයලත් නියෝජිතයන්ට පමණක් ලංසු ඉදිරිපත් කර හැකි වන පරිදිද සීමා පැනවීමට හා ආදර්ශ පරීක්ෂා කිරීම විධිමත් පරිදි ඉදිරියේදී සිදුකිරීමට අපේක්ෂා කරනු ලබයි. |

## 4. යහ පාලනය

### 4.1. අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විශේෂ කාර්ය බලකායේ අභ්‍යන්තර විගණක තනතුර 2016 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතීම මත අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. ඒ අනුව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (ඊ) , හා 40 (1) වගන්තිවල විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන ඒකකයක් කඩිනමින් ස්ථාපිත කිරීමට කටයුතු කර අදාල කාර්යමණ්ඩලය අනුයුක්ත කළ යුතු වීම. | විශේෂ කාර්ය බලකායේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා ගණකාධිකාරී වරයෙකු ලබා දෙන ලෙස ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජෙනරාල් වෙත ඉල්ලීමක් කර ඇත. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විශේෂ කාර්ය බලකායේ අනුමත කාන්තා භට සංඛ්‍යාව 213 ක් වූ අතර එය අනුමත මුළු භට සංඛ්‍යාවෙන් සියයට 2 ක් පමණ විය. එම සංඛ්‍යාව වර්තමාන රාජකාරී අවශ්‍යතාවයන්ට අනුව 1,005 දක්වා 792 කින් වැඩි කර ගැනීමේ අවශ්‍යතාවය 2016 වර්ෂයේ සිට හඳුනාගෙන තිබුණද මේ දක්වා ඉටු වී නොතිබුණි. | අනුමත කාන්තා නිලධාරීන් සංඛ්‍යාව වැඩි කර අවශ්‍යතාවය අනුව කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු වීම. | පැවරී ඇති කාන්තා රාජකාරී ආවරණය කිරීමට අනුමත හා අනුයුක්ත කාන්තා නිලධාරීනියන් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බැවින් වැඩිකර ගැනීමට 2016 වර්ෂයේ සිට පොලිස්පතිතුමා හා අමාත්‍යාංශය වෙත ලිපි ඉදිරිපත් කර ඇත. |